# ආයාචිතභක්ත ජාතකය

තවද එක්සමයෙක්හි තුන්ලෝවාසීන්ට ගෞරවස්ථානීය වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි සතර ඉරියව්වෙන් යුක්තව වැඩ වාසය කරණ සේක් දේවතාවන්ට යාඥාකොට බිලිපූජාව කිරීමක් අරභයා මේ ජාතකය වදාළ සේක. ඒ කාලයෙහි වනාහී මනුෂ්‍යයෝ වර්ණක් කර්මාන්තය පිණිස යන්නාහු මෘග සූකරාදී ප්‍රාණීන් ඝාතනය කොට දෙවතාවන්ට බිලිපූජා කොට අපි අන්තරායක් නැතිව අර්ථසිද්ධියට පැමිණ ආවාහු දෙවතානුභාවයෙන් මේ අර්ථසිද්ධිය වූයේ යයි සිතමින් ඌරන් මුවන් ආදීවූ බොහෝ ප්‍රාණීන් නිසා යාඥාවෙන් මිදෙන පිණිස බිලි පූජා කරන්නාහුය. එසේ කරන්නාවූ බිලිපූජා දැක භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට දන්වන්නාහු ස්වාමීන් වහන්ස. මේ ප්‍රාණඝාත කිරීමෙහි වැඩෙක් ඇද්දොහෝ නැද්දෝහෝයි විචාළාහුය. භාග්‍යවතුන් වහන්සේ භවයෙන් වැසී තුබුනු කාරණය ප්‍රකාශ කොට වදාළසේක.

යටගිය දවස කසීරට එක් ගමෙක්හි කෙළෙඹි පුත්‍රයෙක් ගම් දොරෙහි පිහිටියා වූ නුගවෘක්ෂයෙක වාසය කරන්නා වූ දෙවතාවට බිලිපූජා කෙරෙමියි ප්‍රතිඥා කොට ගොස් අර්ථසිද්ධියට පැමිණ අන්තරායක් නැතිව අවුත් එළුවන් තිරෙළුවන් ආදී වූ බොහෝ ප්‍රාණීන් ඝාතනය කොට ඇයැද ගැණීමෙන් මිදෙමියි සිතා නුග රුක්මුලට ගියේය. නුග වෘක්ෂයෙහි අධිගෘහිත දිව්‍යපුත්‍ර තෙම කඳවෙලෙප්හි සිට මෙසේ කීයේය. පින්වත් පුරුෂය තෝ ඉදින් මින් මිදෙනු කැමැත්තෙහි නම් පරලොව මිදෙනු පරිද්දෙන් මිදේවා, ප්‍රාණ වධාදී වූ දුශ්චරිත කොට දූන් මිදෙන්නේද මතු පාප පාශයෙන් බැඳෙන්නේය. ඒ කාරණය දූන මෙසේ නුවනැත්තාවූ පණ්ඩිත පුරුෂයෝ මතු පාප පාශායෙන් නොබැඳෙන පරිද්දෙන් මිදෙත්. ඊට කාරණා කවරේද?. මෙබඳු මිදීම අඥනයාහට බන්ධනයට කාරණාය. මෙසේ ප්‍රාණඝාත කොට මිදී නම් අඥානයාහට බැඳීමට කාරණා වන්නේයයි කියා ධර්මදේශනා කළ සේක. එතැන් පටන් මනුෂ්‍යයෝ මෙබඳු වූ ප්‍රාණඝාත කිරීමයයි කියන ලද අකුශලකර්මයන් වැලක දානාශීලාදී වූ සුචරිත ක්‍රියාවෙහි හැසිරී දිව්‍යලෝකයෙහි උපන්නාහුය. ශාස්තෘවූ බුදුරජානන් වහන්සේ මේ ජාතක ධර්මදේශනාව ගෙණහැර දක්වා පූර්වාපර සන්ධි ගළපා මේ ආයාචිතභක්ත ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි වෘක්ෂ දේවතාව උපන්නෙම් දූන් තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මමම වේදැයි තමන් වහන්සේ ගෙණහැර දක්වා වදාළ සේක.